# සගවන ආදරයේ උරුමක්කාරයා

අන්සතු දුවෙකුට පියෙක් වූ ඔහු...



ඕෂධී කරුණාරත්න

# සගවන ආදරයේ උරුමක්කාරයා

අන්සතු දුවෙකුට පියෙක් වූ ඔහු...

කතෘ : ඕෂධී ෂවින්ද්‍රී කරුණාරත්න

වෙනත් කෘති : *Singing Doctor 'Alaina'*

කෘතිය පළ කළ දිනය : 2025-02-08

ISBN : 978-624-208-659-0

**මෙම ග්‍රන්ථයේ හමුවන සියලුම චරිත මනක්කල්පිත චරිත වේ. සිහින ගොඩක් මැද තරුණ වියේ දී හමුවුණ අභියෝගයකට මුහුණ දීමට සිදු වූ තරුණයෙකුගේ ජීවිතයේ සිදු වන සතුටුදායක මෙන්ම හැගුම්බර සිදුවීම් කිහිපයක් මෙහි සදහන් වේ.**

ලෝකයේ දරුවන්

වෙනුවෙන් තම ජීවිත කැප කර

වෙහෙස වෙන සියලුම

මව්වරුන්ට හා පියවරුන්ට

මෙම කුඩා ග්‍රන්ථය

උපහාරයක් වේවා!

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

“තමුසෙට දැන්වත් තේරෙන් නැද්ද? දැන්වත් තමුන්ගේ ජීවිතේ ගැන හිතලා වැඩ කරනවා. අනුන් වෙනුවෙන් හැමදේම කැප කරලා වැඩ කළාට තමුන්ට මොනව ද ලැබුණේ?”

“නවත්වන්න හෙන්රි. මං එදා කරපු වැරැද්ද හදා ගන්නයි මම මගේ ජීවිතේ කැප කළේ. හැබැයි මං කවදාවත් හිතුවේ නෑ මං මගේ මුළු ජීවිතේම කැප කරපු කෙනා මට මෙහෙම කරයි කියලා. ඒ යුද්දේ දවස මට එයාව හම්බුන විදිය උඹට මතක ද? ඒක මං නොහිතපු විදියේ අවස්ථාවක්.”

මීට අවුරුදු විස්සකට කලින් ජේම්ස් ඇන්ඩ්‍රර්සන් කියන්නේ මුළු රටම දන්න දක්ෂ හමුදා නිළදාරියෙක්. හෙන්රි දන්නවනේ මගේ එකම හීනය වෙලා තිබුණේ හමුදාවට යන එක කියලා. ඒකට ලොකු හේතුවක් තිබුණා. මං ඉපදෙන්නත් කලින් මගේ තාත්තා මාව ප්‍රතික්ෂේප කරලා දාලා ගිහින්. මං ලෝකෙ එළිය දකිද්දිම මගෙ අම්මා මට නොකියම ආයෙ නොයෙන්නම මේ ලෝකෙන් යන්න ගියා. පොඩි කාළේ ඉදන්ම ළමයෙක්ට ඕනෙම කරන සම්පත, දෙමාපියෝ නැතිව නේවාසිකාගරයක ජීවත් වෙන්න වෙන එක මගේ අවාසනව වෙන්න ඇති. ඉතින් පොඩි කාළේ ඉදන්ම මට ඕනෙ වුණේ මගේ ජන්ම භූමිය ආරක්ෂා කර ගන්න එක. ඒකයි මං හමුදාවට එකතු වුණේ. හමුදාවෙදි තමයි මට උඹව හම්බුනේ. එතැන ඉදන් මගේ කතාව උඹ හොදටම දන්නවනේ...

කොහොම හරි මගේ හීනෙ හැබෑකරගෙන මං හමුදාවට ආවා. අවුරුදු තුනක් හමුදාවෙ වැඩ කරලා රටම දන්න හමුදා නිළදාරියෙක් වෙන්න මට පුළුවන් වුණා. තුන් වෙනි අවුරුද්දේ අවසාන මාස කිහිපය විදේශ රටක් එක්ක ඇති වුණ විශාල යුද්ධය මට කවදාවත් අමතක වෙන්නෙ නම් නෑ. එදා තමයි මේ හැමදේකම ආරම්භය සිද්ද වුණේ. හම්ම්..

හරිම කලබලකාරි දවසක්. හැම තැනම වෙඩි හඩ පැතිරෙනවා. මිනිස්සු බය වෙලා හැම තැනම දුවනවා. මං මුහුණ දුන්න අභියෝගායත්මකම

අවස්ථාව. අපිට අපේ ආරක්ෂාවට වඩා මිනිස්සුන්ගේ ආරක්ෂාව ගැන ගොඩක් ලොකු රාජකාරියක් පැවරිලා තිබුනා. ඒත් මං එදා කරපු වැඩේ නිසා මං අදත් විඳවනවා. ත්‍රස්තවාදියෙක් පිටුපස තනියම හමායන්න මට සිද්ධ වුණා. හැබැයි කිසිම බියක් නැතුව මං ඒ මනුස්සයා පිටිපස්සෙම ගියා. අවසානේ මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. මං ඔහුට වෙඩි තිබ්බා. ඒත්... එදා..............

කිසිම වෙලාවක නොහිතපු විදියකට ඒ පුද්ගලයා ඒ අසළ බියට හැංගෙමින් සිටි කාන්තාවක් ඉදිරියට තල්ලු කර එතැනින් පලා ගියා. මට නවත්වන්න ඕනේ වුණත් වෙඩි උණ්ඩය කාන්තාවගේ පපුව හරහා ගොසින් අවසන්. ඇගේ වේදනාකාරී හඩ මගේ සිතේ සෑම මොහොතකම රැව් දෙනවා. ඊටත් වඩා මගේ සිත කම්පා වුණේ ඇය අසළ සිටි වසරක් වත් වයස නොමැති ළදරුවා දැකීමයි. මං මොකද්ද කරන්න ඕනේ? ඒ වෙලාවේ මගේ සිත නොසන්සුන්. මං ඒ කාන්තාව ළගට ගියා. ඔව්, මං දන්නවා හමුදා නිළ දාරියෙක් නැත්නම් පිරිමියෙක් කියන්නෙ හිත හයිය කිසිම වෙලාවක කඳුළු පිටට පෙන්නන්නෙ නැති කෙනෙක් කියලා. ඒත් ලෝකය කොහොම කීවත් පිරිමියෙක් හමුදා නිළදාරියෙක් කියලා නෑ හැම මනුස්සයාටම තියෙන්නෙ හිතක්. ඒ හිතට දරා ගන්න බැරි දේවලුත් වෙනවා. මං කොහොමද මං පොඩි කාළේ වින්ද දුකම තවත් දෙක හතර නොදන්න ඒ කිරි සප්පයට උරුම කරන්නේ. ඒ මව එදා අමාරුවෙන් කිව්ව වචන වල තිබ්බ මව් සෙනෙහස මං කොහොම ද අමතක කරන්නේ?

‘අනේ... මගේ දරුවා... කරුණා..කරලා මගේ දරුවාව ආරක්ෂා කරන්න.. අහ් අහ්... කරුණාකරලා. එයාව තනි... කරන්න එපා... අහ්... අහ්...’ එ විදියට ඒ මව අවසන් හුස්ම හෙළද්දි මට දැණුන වේදනාව. ඒ දරුවා හඬද්දි මගේ මුළු හදවත්ම පිච්චිලා ගියා. අම්මා කෙනෙක්ගේ තාත්තා කෙනෙක්ගේ ආදරය විඳලා නැති මට ඒක දරා ගන්න අමාරුයි. මට වෙන කරන්න දෙයක් තිබුණෙ නැහැ. එදා ඒ වෙලාවෙ මම යුද්දේ ගැන මොනවත්ම හිතුවෙ නෑ. මං ඒ පුංචි දැරියව මගේ මේ අත් දෙකට ගත්තා. ඒ ලස්සන බෝල මැණික් කැට වගේ ඇස් රෝස පාට කම්මුල්... මම කොහොමද එයාව ඒ වගේ යුද්දයක් මැද තනි කරන්නේ? ඒ වෙලාවෙම මම ඒ පුංචි දැරියව හමුදා ආරක්ෂක මැදිරියට රැගෙන ගියා. එතැන ආරක්ෂිතව ඇයව තියලා මම ආයෙමත් යුද්දෙට ගියා. සතියකට

පස්සේ කොහොම හරි යුද්දේ අවසන් වෙලා ඒ රට සමග සාම ගිවිසුමක් ඇති කරගත්තා. ඉතින් රටට ආයෙමත් සාමය උදා වුණා.

යුද්දේ නිසා ගොඩක් දරුවන්ට තමන්ගේ දෙමපියෝ නැති වුණා. ගොඩක් මිනිස්සුන්ට තමන්ගේ ආදරණීය පවුල් නැති වුණා. යුද්දය අවසන් වූ වහාම මං ගියේ අර පුංචි දැරියව බලන්න. මොකක් නිසාද මන්දා එදා ඒ පුංචි රෝස මල මාව දැකලා මාව හඳුණනවා වගේ හුරතල් හිනාවක් පෑවේ. ඒ දරුවගේ අම්මගේ අවසන් කැමැත්ත වුණේ දරුවාව ආදරයෙන් බලා ගන්න එක. ඉතින් මං පළවෙනියටම ඒ දරුවගේ තාත්තා ගැන විස්තර හෙව්වා. අවාසනාවට ඒ දැරියගේ පියත් යුද්දය මැද අවසන් හුස්ම හෙළලා. මට තාමත් තෙරෙන් නැත්තේ ඇයි මේ ලෝකෙ පුංචි ළැමයින්ව මේ විදියට තනි වෙන්නෙ කියලා.

ඒ විදියට යුද්දය නිසා දෙමාපියෝ අහිමි වුණ දරුවන්ව රජය භාරයට අරගෙන නේවාසිකාගාරයේ නවත්තන්න පියවර අරගෙන තිබුණා. ඒත් මං කොහොමද ඒ පුංචි රෝස මලගේ මුහුණ දිහ බලාගෙන එයව නේවාසිකාගාරයේ නවත්වන්නෙ. ඊටත් වඩා ඒ මගේ අතින් මියගිය ඒ අම්මාගේ බලාපොරොත්තුව නැති කරන්නෙ. පුංචි කාලේ දෙමාපියෝ නැති අඩුව මට හොඳටම නේවාසිකාගාරය තුළ දැණුනා. ඒ තනිකමත්, දුකත් මං කොහොමද ඒ රෝස මලට දෙන්නේ? ඊටත් මං නිසයි ඒ අම්මා මේ දරුවව තනිකරලා අවසන් හුස්ම හෙළුවේ. මට ඒක කවදාවත් අමතක කරන්න බෑ. ඉතින් ඒ නිසයි මං ඒ දරුවව හදාගන්න ගත්තේ.

ඒ වයසට මං ගොඩක් තරුණයි. මං දන්නෙ නෑ කොහොමද දරුවෙක් බලා ගන්නෙ කියලා වත්. ඒත් මං මට පුළුවන් හැම විදියකටම එයාට ආදරය කළා. අදටත් එයා දන්නෙ නෑ මං එයාගෙ තාත්තා නොවන බව. මට කවදාවත් ඒක කියන්න ඕනෙ වුණෙත් නෑ. මොකද මම බය වුණා මට එයාව අහිමි වෙයි කියලා. ටික ටික කාලේ ගත වෙනකොට මට හමුදාවෙ වැඩ නිසා දරුවා ගැන බලන්න බැරි වෙන අවස්ථා ගොඩක් ආවා. ඒක නිසයි මේ ලෝකෙ මට කරන්න කැමතිම රැකියාව පවා මං අතහරින්න කැමති වුණේ.



මොකද මං කැමති නෑ ඒ රෝස මලට පොඩි හෝ දුකක් දෙන්න. නමුත් මං ඒ රෝස මල ගැන කිසිම තොරතුරක් දන්නේ නෑ. ඉතින් ඒ ලස්සන ඇස් රෝස පාට කම්මුල් , හුරතල් හිනාව නිසා මං එයාට කැමීලියා ඇන්ඩර්සන් කියලා නම තිබ්බා. මොකද පුංචි දැරිය සැබවින්ම කැමීලියා මලක් වගේමයි.

හමුදාවෙන් ඉවත් වුණ නිසා මට ජීවත් වෙන්න රැකියාවක් කරන්න සිද්ධ වුණා. ඒත් කැමීලියාවත් බලාගෙන රැකියාවක් කරන එක ගොඩක් අමරුයි. මොකද කැමිලියා කියන්නේ තවමත් තනියම වැඩ කර ගන්න බැරි කුඩා දරුවෙක් නිසා. ඒකයි මං හනාගෙන් උදවු බලාපොරොත්තු වුණේ.

හනා මිලර් කියන්නේ මගේ පළමු හා අවසාන පෙම්වතිය. අවුරුදු විස්සක් ගතවෙලත් මට තාමත් මතකයි ඒ ආදරණීය චරිතය. හනාට හැමවෙලේම කෙනෙක්ගෙ දුකක් හොදින් තේරුම් ගන්න පුළුවන් වුණා. ඒවගේම උදවු අවශ්‍ය ගොඩක් අයට එයා පුළුවන් විදියට උදවු කළා. මං හනාට ආදරය කරන්න ලොකුම හේතුව වුණේ ඇයට තිබූ ඒ කරුණාවන්ත අවංක හදවත. මට හනාව මුණ ගැසුනේ හමුදා පුහුණුවීම් කාලයේදී. හැමදාම වගේ එදත් හනා මාව හොදින් තේරුම් ගත්තා. හනා, කැමීලියාට මටත් වඩා ආදරය කළා. ඒ වගේම පුළුවන් හැමවෙලේම මට හැකි අයුරින් උදවු කළා.

කැමීලියාව රැකබලාගෙන එදිනෙදා අවශ්‍යතා සපුරා ගන්න මට රැකියාවක් කරන්න සිද්ධ වුණා. ඒත් ලොකු  රැකියාවක් කරන්න තරම් මට හැකියාවක් තිබුණේ නෑ. අවසානේ මං මගේ ගෙදර ළග තිබුන පොඩි හෝටලයක සේවය කළා. ලොකු මුදලක් නොලැබුනත් ඒ මුදල මට කැමීලියා සමග ජීවත් වීමට ප්‍රමාණවත් වුණා. රස්සාවට ගිය හැම දවසකම කැමීලියව ආදරයෙන් බල ගත්තෙ හනා. මට හනා ගැන පුදුමයි. තමන් නොදන්න වෙන කෙනෙකුගේ දරුවෙක් එච්චර ආදරයෙන් බලා ගන්න පුළුවන් ද? එදා ඒ මාව විශ්වාස කරලා මට උදවු කරපු හනාට මම තාම ණයගැතියි. හනා මට මේ විදියට උදවු කළේ රහසින් මොකද එයාගේ දෙමාපියෝ ගොඩක් සල්ලිකාර වංශගත පවුලක්. ඉතින් මං වගේ හෝටල් සේවයකුට උදවු කරන්න බව හනාගේ දෙමාපියෝ දැනගත්තොත් ඒකට අකැමැති වෙයි කියලා හනා හිතුවා. කමීලියාට වයස අවුරුදු තුනක් වෙනකම්ම හනා තමයි එයාට අම්මා වුණේ.

ඒත් දවසක්.... හනා කැමීලියාව බලන්න මගේ ගෙදරට ආවේ ගොඩක් කලබලයෙන්.

"ජේම්ස්, අනේ මට සමාවෙන්න. මං... මෙහෙට ඇවිත් දුවව බලාගන්නවා දවස් කීපයක්ම අපෙ තාත්තා දැකලා. මං එයාට තේරුම් කරන්න උත්සහ කළා. ඒත් එයා මාව තේරුම් ගන්නෙ නැහැ. අනේ මට තව දුරටත් ඔයාවවත් දෝණිවත් හම්බවෙන්න වෙන්නෙ නැහැ. මට සමාවෙන්න. මං කවදාවත් ඔයාට මෙහෙම කරන්න හිතුවෙ නෑ. මං හිතුවා තාත්තා අපේ සම්බන්දෙ ගැන දැනගත්තම ඔයාට උදවු කරන්න ඉඩදෙයි කියලා. ඒත්...... තාත්තා ඒකට විරුද්දයි. මං අද ඔයාව හම්බෙන්න ආවේ ගෙදරට හොරෙන්. මොකද මගේ තාත්තා මාව හෙට ඔස්ට්‍රේලියාවෙ යවන්න තීරණය කරලා. අනේ මට සමාවෙන්න..." එදා හනා එයාගේ ලස්සන ඇස් කඳුළු වලින් තෙමමින් මට එහෙම කිව්වේ. මට තාම මතකයි එදා එයාගේ හිතේ තිබුණ වේදනාව.

"මට ආයේ කවදාවත් ඔයාවවත් කැමීලියවවත් බලන්න එන්න බැරි වෙයි.අනේ මට සමාවෙන්න...හහ්.. හහ්. හහ්..." ඒ හනා මාව වැළඳගත්ත අවසාන මොහොත. මට ඒ මූණ දිහා බලාගෙන කියන්න ගොඩක් දේවල් තිබුණා. ඒත් මට ඒ හැමදේම එදා කියන්න බැරි වුණ එකට මට තාම වේදනයි.

"කෝ... මේ බලන්න. මං මෙච්චර කාලෙකට දැක්ක ලස්සනම හදවත තියෙන්නෙ වෙන කාටවත් නෙමෙයි ඒ ඔයාට. ඔයා මට මෙච්චර කාලයක් කරපු උදවු ඒ ආදරය මට කවදාවත්ම අමතක වෙන්නෙ නෑ. කැමීලියාටත් එයාගෙ අම්මාව කවදවත් අමතක වෙන්නෙ නැති වෙයි. ස්තූතියි මේ හැමදේකටම." මට වචන වලින් කියන්න පුළුවන් වුණේඒ එච්චරයි.

ඒ වෙලාවේ හනා කමිලියාව අමතක කළේ නැහැ. කමීලියා ළගට ගිහින් එයාව සිප ගෙන අවසාන වතාවට එයව තුරුලට ගත්තා. "මගේ දුව ලොකු වෙලා තාත්තා වගේ හොඳ කෙනෙක් වෙන්න ඕනෙ තේරුණා ද.. අම්මව මතක තියාගන්නවා නේද මගේ දෝණි." හනා කැමීලියාට සමු දුන්නේ ඒ විදියට.

“මට ඔයාට කියන්න දෙයක් තියෙනවා. මං ඔයා වගෙ කෙනෙක් මීට කලින් දැකලා නෑ. ඒකයි මං ඔයාව හැම වෙලේම විශ්වාස කළේ. මේ වගේ පුංචි, දෙමාපියෝ  අහිමි වුන කෙනෙක්ට ඔයාගෙන් තරම් ආදරයක් ලැබෙන්න නැතුව ඇති වෙන කොහෙන්වත්.” හනා එහෙම කියලා කැමීලියාටයි මටයි සමු දුන්නා.  මමත් කවදාවත් දැකලා නෑ වගේ අවංක ආදරණීය චරිතයක්.

ඇත්තටම මං කවදාවත් හනාට වැරැද්දක් කියන්නෙ නෑ. මොකද එයා එයාට පුළුවන් විදියට මට උදවු ඕනෙ වෙලාවේ උදවු කළා. එයා අපේ සම්බන්දෙ කඩලා දමලා මගෙන් ඈත් වුණා තමයි. ඒත් මං දන්නවා එයා ඒක කලේ අකැමැත්තෙන් කියලා. සමහර විට දැන් හනා වෙන කෙනෙකුගේ ආදරණීය බිරිදක් වෙන්න ඇති.

දැන් කැමීලියාට අවුරුදු තුනක් නිසා මට රස්සාවයි එයාව බලා ගන්න එකයි දෙකම කරන්න පුළුවන් වුණා. ඇත්තටම මට කැමීලියාව දකිද්දි හනාව ගොඩක් මතක් වුණා. හනා එයට තිබුණ හොද ගතිගුණ හැමදෙයක්ම කැමීලියාට භාරකරලා. අතීතෙ වෙච්ච කිසිම දෙයක් නොදන්න මගෙ පුංචි කෙල්ල කැමීලියා හනාව ඇගේ මව ලෙසත් මාව පියා විදියටත් පිළි අරගෙන. මට තේරෙන් නෑ මං ගොඩක් කැමීලියාට ලං වුණා. මං හිතන්නේ ඒ එයා මට තාත්තා කියන මේ ලෝකේ වටිනාම පදවිය දුන්න නිසා වෙන්න ඇති. තද දුඹුරු පැහැති කැරළි හිසකෙස් කෝපි පාට ඇස් ලා රෝසවන් කම්මුල් නිසා කැමීලියාගේ සුන්දරත්වය තව තවත් වැඩි වුණා.

මට මතකයි දවසක් හෝටලේ වැඩ ඉවර වෙන්න ටිකක් පරක්කු වුණා. ඉතින් මං එනකම් කැමීලියා ගෙදර තනියම. ඉතින් පුළුවන් ඉක්මණට මං ගෙදරට ගියා. ගෙදරට යද්දිත් සාලෙ කොනක තියලා තිබුණ ටෙඩියව තුරුලු කරගෙන කැමීලිය හොදටම අඩනවා. මං එයාව දැක්ක ගමන් දුවලා ගිහින් එයාව වඩා ගත්තා. අඩන්න හේතුව අහද්දි එයා මට කිව්වෙ මොකද්ද කියලා දන්නවා ද? මං කවදාවත් හිතපු නැති දෙයක්.



“මං… මං… හඟ්.. හඟ්… හිතුවා අම්මා වගේ තාත්තාත් මාව දාලා ගියා කියලා. හඟ්… හඟ්…”

මං හිතුවට වඩා කැමීලියාට දැන් ගොඩක් දේවල් තේරෙනවා. මට එයා එහෙම කියද්දි ගොඩක් දුක හිතුණා. බැරිවෙලාවත් එයා එයාගෙ ඇත්ත දෙමාපියො ගැන දැනගත්තොත් ගොඩක් දුක් වෙයි. කොහොමත් අම්මා කෙනෙක් ගැහැනු දරුවෙක්ට ඕනෙමයි කියලා මං දන්නවා. ම කොච්චර ආදරය කළත් දරුවෙක්ට අම්මගේ ආදරය ලබා දෙන්න පියෙකුට අමාරුයි.මං මට පුළුවන් විදියට කැමීලියව සනසච්චා.

“කවුද මගේ පැටියට කිච්චේ අම්මා දාලා ගියා කියලා. අම්මා කොහේහරි ඉදන් මගේ පැටියා දිහා බලන් ඇති. කෝ දැන් කඳුළු පිහගන්න. අනික… ඇයි තාත්තා මේ වගේ ලස්සන හුරුබුටි සුරංගනාවිව දාලා යන්නේ… තාත්තා පැටියට ගොඩාක් ආදරෙයිනේ…”

“ඇයි අම්මා මාව බලන්න එන්නෙ නැත්තේ? මං නරක ළමයෙක් ද? නැත්නම් කැත ළමයෙක් නිසා ද? අම්මා මට ආදරේ නැද්ද?” කැමීලියාගේ ප්‍රශ්න කෝටියකට මට උත්තර දෙන උනා.

කවුරු කොහොම කිච්චත් මට දැණුයි තෙරෙන්නේ පොඩි දරුවෙක් බලාගන්න එක කොච්චර අමාරුද කියලා. මගේ අවාසනාව නිසා වෙන්න ඇති මං වැඩ කරපු හෝටලයේ අයිතිකාරයෝ හෝටලය විකුණලා දාලා යන්න ගියේ. ඉතුරු කරගත්ත මුදල් ටිකක් තිබුණ නිසා සතියක් විතර මායි කැමීලියයි හොදින් ජීවත් වුණා. ඒත් ඉතින් ඒ සල්ලිත් ඉවර වෙන දවසක් එනවනේ. මට රස්සාවක් හොයා ගන්න ගොඩක් අමාරු වුණා. මොකද මට කැමීලියාවත් බලාගන්න ගමන් රස්සාව කරන්න වෙන්නෙ කියලා කිච්චාම ගොඩක් අය මාව රස්සාවට ගන්න අකැමැති වුණා. සතිය ඉවර වෙනවාත් එක්කම සල්ලිත් ඉවර වීගෙන ගියා මටයි කැමීලියාටයි කන්න වත් ගන්න මං ළග සල්ලි තිබ්බෙ නෑ. එහෙමයි කියලා මං කැමීලියාව බඩගින්නෙ තියන්නෙ කොහොමද? මට වෙන කරන්න දෙයක් නැතිම නිසා එදා රෑ මං… පාරේ ගමන් කර කර හිටිය ධනවත් වගේම තරුණ මෙන් පෙණුන කෙනෙක්ගේ පසුම්බිය සොරකම් කළා. මට හිතාගන්න බෑ ඒ මමමද කියලා. කවදාවත්ම සොරකමක් සමාජ විරෝධි

ක්‍රියාවක් කරන්න හීනෙකින් වත් හිතපු නැති මම එදා සොරකම් කළා. මට එදයි තේරුණේ කෙනෙක් අසරණ වුණාම ඒ කෙනාට ඕනම දෙයක් කරන්න පුළුවන් කියලා.

ඒත් ඒ පසුම්බියේ අයිතිකරු දිගින් දිගටම මගේ පිටුපස දුවන් ආවා. මාත් වේගෙන් දිව්වා. මං ගොඩක් බය වුණා. ඒකෙනාට මාව අහුවුණොත් මාව පොලිසියට අල්ලලා දෙයි කියලා. එහෙම වුනොත් කැමීලියාව බලාගන්නෙ කවුද? මගේ හිතේ ප්‍රශ්න කෝටියක් කැරකෙනවා. බලපොරොත්තු නොවුණ විදියට මං පාරේ ගලක හැප්පිලා බිම වැටුණා. කකුල වේගයෙන් වැදුන නිසා මට ගොඩක් ලොකු වේදනාවක් ඇති වුණා. ඒ වගේම මම බය වුණා. මොකද ඒ වෙද්දිත් පසුම්බියේ අයිතිකරු මං ළගට ඇවිත් අවසන්... ඒත් එකපාරටම......

"ජේම්ස්..."

"අහ්... සාරා..." මං ගොඩක් පුදුම වුණා.

ඒ පසුම්බිය අයිති වෙලා තිබ්බේ සාරාට. සාරා කියන්නේ මං පුංචි කාළේ බලාගත්ත නේවාසිකගාරයේම හිටිය ගැහැනු ළමයෙක්. නේවාසිකාගාරයෙන් ආවත් හරි එදා තමයි සාරාව ආයෙමත් දැක්කේ.

"බොහොම හොදයි හමුදාවට යනවා කියලා නේද ගියේ ආ... දැන් ඔයගේ රස්සාව හොරකම් කරන එක ද ජේම්ස්. ඇත්තමයි වෙන කෙනෙක් වුණානම් මගෙන් හොදට කනවා. දැන් නැගිටිනවා." ඔයාටම තේරෙනවා නේ සාරා ටිකක් තරහා යන කෙනෙක් ඒත් ඒ වගේ වෙලාවක නම් එතන ඉන්න ඕනෙම කෙනෙක්ට තරහා යනවා. මං ගොඩක් අමාරුවෙන් නැගිට්ටා. ලැජ්ජාවෙන් වුණත් හොරකම් කරපු පළමු හා අවසාන පසුම්බිය මං ආයෙමත් සාරාට දුන්නා.

"ගොඩ කාලෙකින්... සාරා ඔයා මෙහෙ මොකද කරන්නේ?"

“මං මොකද කරන්නේ නෙවෙයි. දැන් ඔයා මොකද්ද කරේ කියලා මට පැහැදිළි කළොත් හොදයි. ජේම්ස් මේ ඔයාම ද? මං කවදාවත් හිතුවේ නෑ ඔයා මෙහෙම දෙයක් කරයි කියලා. මට ඇත්ත කියන්න. මොකද මේ?” සාරා මගෙන් ප්‍රශ්න වැලක් ඇහුවා.

මං කිසි දෙයක් හංගන්නෙ නැතිව කමීලියා ගැනත් හමුදාවෙන් අයින් වුණ එක ගැනත් දැන් මං ඉන්න තත්වෙ ගැනත් ඔක්කොම සාරාට කිව්වා. සාරාට ඉක්මණින් කේන්ති යන එක ඇත්ත. ඒත් එයා මගේ කතාව තේරුම් ගත්තා. ඒ නිසාම එයා මං එක්ක අපේ ගෙදර යන්න ආවා. හිස් අතින් නෙවෙයි කැමීලියාට කන්න කෑමත් අරගෙන.

“ඒ කියන්නේ ජේම්ස් හමුදාවෙන් අයින් වෙලා දැන් ගොඩක් කල් නේද?”

“හ්ම්... ඒක නෙවෙයි සාරා දැන් මෙහෙ මොකද කරන්නේ?” මටත් සාරාගෙන් අහන්න ගොඩක් ප්‍රශ්න තිබ්බා.

“මං මෙහෙ කරාටි පන්ති කරනවා ජේම්ස්. ඒ දවස්වල ඉදන් මං ගහගන්න ගොඩක් කැමතිනේ.”

“ඒක තමා මගේ පිටිපසෙන් අව්වර වේගෙන් දුවන් ආවේ...බයෙත් බෑ ළග ඉන්න.”

කතාවෙන් කතාව මමයි සාරායි අපේ ගෙදරට ගියා. දොර ඇරිය ගමන්ම....

“තාත්තා............”

මගේ පුංචි කැමීලියා දුවගෙන ඇවිත් මාව බදා ගත්තා.

“ආනේ... මගේ පුංචි මල් කැකුල. තාත්තා එනකම් ද බලන් හිටියේ?” මං එයාව වඩා ගත්තා.

“ජේම්ස්, ඔයා මට කිව්වෙ මෙයා ගැන ද? ඇත්තමයි ඔයා කිව්වටත් වඩා ලස්සන හුරුබුහුටි පැටියෙක් නේ. දන්නව ද කැමීලියා ඔයාගෙ තාත්තා ඔයා

ගැන ගොඩාක් දේවල් මට කිව්වා.'' සාරාත් කැමීලියාට ගොඩක් ආදරයෙන් කතා කලා.

''දූ... මේ ඉන්නෙ සාරා නැන්දි. මගේ පරණ හොද යාළුවෙක්. බලන්න නැන්දා දූට දෙන්න මොනවද ගෙනත් තියෙන්නෙ කියලා.''

''ඩෝනට්... මං කැමති ඩෝනට් වලට. තැන්ක් යූ සාරා නැන්දී...'' එදා කැමීලියා සාරාව වැළඳගෙන ඩෝනට් අරගෙන ගේ ඇතුළට ගියා.

''ඇත්තටම ජෙම්ස් ඔයා ගැන මට හිතා ගන්න බෑ. ඒ දවස්වල ඉදන් ඔයාට තිබුණ හීනය හමුදාවට යන එක. ඒත් මේ වගේ දරුවෙක් වෙනුවෙන් ඔයා හමුදාවෙන් පවා ඉවත් වෙලා මේ විදියට කැප වෙනවා කියලා දැක්කම මට පුදුමයි. ගොඩක් අය හිතන්නෙ තමන් ගැන නැත්නම් තමන්ට ලැබෙන වාසිය ගැන ඒත් ඔයා ඔයාගේ මුළු ජීවිතයම කැමීලියා කරගෙන. ඔයා වගේ මේ විදියට හැමෝම හිතනවා නම් අද ලෝකය කොච්චර ලස්සන ද?'' සාරා එදා මට කිව්ව ඒ වදන් මට තාම හොදට මතකයි.

''නෑ සාරා, මං හින්දයි කැමීලියාට එයාගේ ඇත්ත දෙමාපියෝ නැති වුණේ. මං ඒකට තාම විදවනවා. එයා තාම දන්නේ මං එයගේ තාත්තා කියලා. කවදා හරි දවසක එයා එයා ගැන ඇත්ත දැනගත්තොත් මාව දාලා යයි කියන බය මං ගාව තියෙනවා. මොක ද දැනටමත් කැමීලියා මගේ මුළු ජීවිතේම වෙලා ඉවරයි. මං එයාට ගොඩාක් ආදරෙයි. ඒත් මේ යන විදියට මට එයාව බලා ගන්න එක ගොඩක් අමාරු වෙයි. මොකද එයාව බලා ගන්න මං ළග සල්ලි නෑ. රස්සාවක් නෑ. මට තේරෙන්නෙ නෑ මං මොකද්ද කරන්න ඕනේ කියලා.'' මං එදා හැම දෙයක්ම වගේ සාරාට කිව්වා.

'' ජේම්ස් ඔයා කැමති නම් විතරක් මං කියන මේ රස්සාව හොඳද බලන්න. මං දැක්කා ටවුන් එකේ ලොකු ගොඩනැගිල්ලක වේකන්සීස් තියනවා කියලා දාලා තිබ්බා. එතැනින් පොඞ්ඩක් අහලා බැලුවොත්....''

''මේ වෙලාවේ හැටියට ඕනෙම රස්සාවක් කමක් නෑ. කැමීලියා වෙනුවෙන් ඕනෙ දෙයක්.''

ඊළඟට උදේම මං ගියේ ඒ ගොඩනැගිල්ලෙ කිව්ව රස්සාව බලන්න. ලොකු රස්සාවක් නොවුනත් ඒ වෙලාවේ හැටියට මං ඒ රස්සාව කරන්න සූදානම් වුණා. එතැන තිබ්බේ හැමදාම ඒ ගොඩනැගිල්ල අතුගාන්නයි , දොර ජනේල පිරිසිදු කරන්න වගේ වැඩ. ඉතින් මං කිසිදු දෙයක් නොහිතා ඒ වැඩෙත් කරා. ඒකෙන් ලැබුණ මුදලින් මායි කැමීලියායි හොදින් ජීවත් වුණා.

කැමීලියාට මගෙන් වෙන්න ඕනෙ හැමදෙයක්ම මං කළා කියලා මං හිතනවා. එයාට අවුරුදු පහ වෙද්දි මං එයාව නගරේ තිබ්බ හොදම පෙරපාසලකට ඇතුළත් කළා. එයාට ඕනෙ කරන හැමදෙයක්ම පුළුවන් විදියට අරන් දුන්නා.

''තාත්තී... මේ පාර අපේ මොන්ටිසෝරියේ තියෙන ප්‍රසංගයට මගේ හැමෝම යාළුවෝ යනවා. ඒත් මම කොහොමද යන්නේ?''

''ඇයි කැමීලියා එහෙම කියන්නේ? දූටත් යන්න පුළුවන්නේ...''

''මං කොහොමද යන්නේ? අනිත් හැමෝටම ඒකට අදින්න ලස්සන ගවුම් තියෙනවා. මං ඒකට අදින්නෙ මොකද්ද? මං ළඟ ලස්සන ගවුම් නැනේ...'' කැමීලියා ගොඩක් දුකින් එහෙම කියද්දි මං කොහොම ඒ දේවල් අහන් ඉන්න ද?

''අයියෝ... මේකද ප්‍රශ්නේ... ආහ් ඉන්න තාත්තා හෙට එද්දි දූවට ලස්සනම ලස්සන ගවුමක් අරන් එන්නම්කෝ... එතකොට මගේ කැමීලියාට යාළුවෝ එක්කම ප්‍රසංගයට යන්න පුළුවන්.''

''මගේ හොද තාත්තී...'' කැමීලියා සතුටින් උඩ පැන පැන නැටුවා.

මං එදා එයාට එහෙම කිව්වට මට ලස්සන ඇදුමක් තියා ඇදුමක් ගන්නවත් සල්ලි තිබුණේ නැහැ. දවසේ වියදම පවා මං ගොඩක් අමාරුවෙන් පිරිමසා ගත්තේ. එහෙමයි කියලා මං කොහොමද කැමීලියාට ඒ ගැන කියන්නේ? මං ගවුමක් අරන් එන්නම් කිව්වම එයා සතුටින් උඩ පැන්න විදිය... වැඩ කරන තැනින් එදා මං සල්ලි ටිකක් වැඩියෙන් ගන්න පුළුවන්ද ඇහුවා. ඒත්...

‘‘තමුසෙට ඕනෙ ඕනෙ වෙලාවට සල්ලි වැඩියෙන් දෙන්න අපි සල්ලි ගස් වලින් කඩන්නෙ නැනේ. ඒ මදිවට ගිය මාසෙට කලින් මාසේ ගත්ත ණය තාම ගෙවලා ඉවර කරලා නැහැ. දෙන මුදල අරන් වැඩ කරනවා. නැත්නම් යනවා වෙන තැනකට. අපිට පුළුවන් හොද සේවකයෙක් ගන්න.’’ මං වැඩ කරපු තැන අයිතිකාරයෝ ගොඩක් වසයි. එහෙමයි කියලා මොනවා කරන්න ද?

‘‘ අනේ කරුණාකරලා එහෙම කියන්න එපා. මට රස්සාව නැති වුණොත් මායි දුවයි ජීවත් වෙන්නෙ කොහොමද? හරි මට වැඩිය සල්ලි එපා. මට මේ රස්සාව දිගටම කරන් යන්න ඉඩ දෙන්න. මං ඉක්මණින්ම ණය ගෙවලා ඉවර කරන්න බලන්නම්. කරුණාකරල ටික කාලයක් දෙන්න.’’ ඒ දවස් වල මං ගොඩක් අසරණයි.

සල්ලි නැහැයි කියලා කැමීලියාට දුන්න පොරොන්දු නැති කරන්නේ කොහොමද? මං එදා කැමීලියාට විතරක් රෑට කෑම ගෙදරට අරන් ගිහින් ආයේ ගියා රෑ පොඩි කඩයක බඩු ගෝනි ඇදලා දෙන්න. එතැනින් දුන්න සල්ලි ටිකයි මගේ රෑ කෑම ගන්න තිබ්බ සල්ලි දෙකම දාලා මං කැමීලියාට ලස්සන ලා රෝස පාට ගවුමක් මිළ දී ගත්තා. ඒක ගෙදර අරන් ගිහින් කැමීලියාගේ අතට දුන්නම එයා සතුටින් දුවල ඇවිත් මාව බදාගත්තා. මං හැමදාම වෙහෙසුනේ එයාගේ ඒ හිනාව දකින්නයි. ඒ හිනාව සතුට නිසාම මට දැනිලා තිබුණ වෙහෙස කුසගින්න කොහෙන් අතුරුදහන් වුණාද කියලා මට හිතා ගන්න බැහැ.

පෙරපාසල් ගමනින් පසු මම කැමීලියාව හොද පාසලකට දාන්න උත්සාහ කළා. මට ඕනේ වුණේ කැමීලියාට හොදට උගන්නලා හොද සතුටින් ජීවත් වෙන්න පුළුවන් විදියට එයාගේ අනාගතේ හදන එක. හොද පාසලකට දැම්මත් පාසලේ වියදම් නම් ගොඩක් වැඩියි. ඒත් මං මට පුළුවන් විදියට ඒ වියදම් ඔක්කොම බලා ගත්තා. කර කර හිටිය රස්සාවට අමතරව රෑට බඩු ගෝනි උස්සන එක වගේම කඩවල් කිහිපයකට පුංචි පුංචි මුරුක්කු පැකට් දාලා මං අමතර මුදලක් ලබා ගන්න කටයුතු කළා. කැමීලියාට වයස අවුරුදු දහතුන වෙද්දි පුංචි කාලේ එයාට තිබුණ ලස්සන පෙනුම තව තවත් වැඩි වුණා. දිග කැරළි කොණ්ඩය, තද දුඹුරු පැහැයට හුරු ඇස්, රෝස පාට කම්මුල් වගේම

හුරුබුහුටි හිනාව නිසා කැමීලියා දිගින් දිගටම ආකර්ෂණීය වුණා. ඒ කාලය නම් මට අමතක කරන්න අමාරුයි. මං කැමීලියා එක්ක කොච්චර සතුටු වුණා ද? ඒ කාලය කවදවත් අමතක වෙන්නෙ නෑ. දවසක් කැමීලියාව හවස ගන්න පාසලට ගියා. ගෙදරට එන අතරමග දී...

"තාත්තා දන්නව ද මේ පාර ස්කූල් එකේ චිත්‍ර තරගේ හොදම චිත්‍රයට තේරිලා තියෙන්නෙ මගේ චිත්‍රය."

"ශා... කොච්චර හොද ද? මට දුව එහෙම තරගයක් ගැන කීවේ නැනේ..."

"ඔව් ඉතින්. තාත්තා හැමදාම එද්දි රෑ වෙනවනේ. ඉතින් කියන්න අමතක වුණා. සොරී..."

"අහ්... දැන් කියන්නකෝ බලන්න මගේ දුව මොකද්ද චිත්‍රයට ඇන්දේ?"

"මම... මම ඇන්දේ හිත යට ආදරය හංගන් ඉන්න ආදරවන්තයෙක්ව."

"මම්.. මොකද්ද? කවු ද අනේ ඒ?"

" වෙන කවු ද ඉතින් ඒ මගේ තාත්තා. මං දන්නවා ඔයා පෙන්නනවාට වඩා ආදරයක් ඔයාගේ හිතේ තියෙනවා කියලා. ඒකයි මං එහෙම කිව්වේ. අනික තාත්තා තමයි මගේ මුළු ලෝකෙම. එකනේ මං මෙච්චර ආදරේ...උම්මා." එදා කැමීලියා එහෙම කියලා මගෙ කම්මුල සිප ගත්තා. මටත් එදා මගේ දුව නිසා පොඩි ආඩම්බරයකුත් දැණුනා.

" ඔව් ඉතින් මාත් මගේ කැමීලියාට නැතුව වෙන කාට ද ආදරේ... හරි හරි තරගෙ දින්න නිසා මගෙන් මොනා ද දුවට අරන් දෙන්න ඕනා? ආ... අපි එහෙනම් යමු මගේ කැමීලියා කැමතිම චොක්ලට් අයිස් ක්‍රීම් කන්න.."

" දැක්කනේ තාත්තා මං කැමති හැමදෙයක්ම දන්නවා.........."

එයාගේ ඒ සතුට ආදරය බලන්නයි මං කැමති වුණේ. ඒත් කැමීලියා ලොකු වෙන්න වෙන්න සිද්ධ වුණ වෙනස් වීමට බලපෑවේ මම ද, පාසල ද , යාළුවෝ ද කියන්න මම තාම දන්නෙ නෑ. ටිකෙන් ටික මොනවා වුණාද කියලා මට හිතා ගන්න බැහැ. කැමීලියාට වයස අවුරුදු පහළවේ දී....

“අනේ තාත්තේ දැන් මං ලොකුයි නේ මට පුළුවන් තනියම ගෙදර එන්න. හැමදාම එකම ෂර්ට් එකත් ඇඳගෙන මාව ගන්න ස්කූල් එකට එන්න එපා. මට මෙහෙම ලැජ්ජා කරන්න එපා.”

“ අනේ දුවේ, ඉස්සර දුවමනේ කියන්නේ හවසට තනියම එන්න බැහැ ගන්න එන්න කියලා. හරි හරි තරහ ගන්න එපා හෙට දුව තනියම එන්නකෝ. අනික ඔයා කොච්චර ලොකු වුණත් තාම මට නම් ඔයා මගේ පුංචි රෝස මලම තමයි”

“හරි හරි, යමු දැන් ගෙදර”

සමහර විට එදා මං නිසා එයාට ලැජ්ජ වෙයි කියන බයට වෙන්න ඇති කැමීලියාට තරහ ගියේ. මොනවා වුණත් දරුවෙක් කොච්චර ලොකු වුණත් කොච්චර උසස් තැනක්ට ගියත් දෙමාපියන්ට තමන්ගේ දරුවෝ හැමදාම පුංචියි. ඒ දෙමාපියන්ගේ විදිය. ඒත් කැමීලියාට මගේ අතින් වරදක් වෙලා ද?

“අනේ තාත්තේ ඔයා ඔය හැමදාම ගෝනි උස්සන්නයි මුරුක්කු පැකට් විකුණන්නයි යන එක නතර කරන්න. මගේ යාළුවෝ මට විහිළු කරනවා. ඔයා දන්නව ද මට එයාලා කියන දේ? එයාලා මට කියනවා. ‘කැමීලියා කොච්චර ඉගෙන ගත්තත් වැඩක් නැනේ තාත්තා අච්චර ගොඩේ වුණාම. ඊයා මං ඔයා ගැන දැනන් හිටියා නම් කොහෙත්ම ඔයත් එක්ක නම් යාළු වෙන්නෙ නැහැ…’ මං කොහොමද තාත්තේ මේවා අහගෙන ඉන්නේ. මේ හැමදේම ඔයා නිසා. මේක නම් මහ කරුමයක්.”

“ අනේ පුතේ ඒ  දේවල් නිසා නේ අද ඔයා කාලා ඇඳලා සතුටින් ඉන්නේ. ඇයි මේ එකපාරටම මෙහෙම කියන්නේ. මං මේ හැමදෙයක්ම කරන්නේ මගේ දුවටනේ… ලෝකේ හැම කෙනෙක්ම පොහොසත් නෑ. මං දුප්පත් වුණත් මට ඕනේ මගේ දුවට හොදට උගන්නලා පොහොසත් කරන්නනේ.”

“අප්පෝ.. ඇති, ඇති. කවුද කියන්නේ මං සතුටින් කියලා. තාත්තාගේ ආදරය තිබ්බට හැමදාම තාත්තා නිසා මට ලැජ්ජ වෙන්නයි වුණේ. අනික හැමතැනකදිම මට දුව කියන්න එපා. මං කැමීලියා... කැමීලියා.. හරිනේ..”

කැමීලියාගේ මේ වෙනස් වීම මට නම් හිතා ගන්න බැහැ. පුංචි කාලේ හිටපු හරි හුරතල් අහිංසක මගේ දුව ද මේ.  ඉස්සර තත්තාත් එක්ක ඉන්න නිතරම උත්සහ කරන කැමීලියා දැන් තාත්තා දුව කියලා කතා කරනවාට පවා අකැමැති වෙලා. මගේ කැමීලියා මල මගෙන් ගොඩක් දුරස් වෙන්න ගත්තා. දවසක්...

“ඔන්න මං අද මගේ කැමීලියා කැමතිම ඩෝනට් ගෙනාවා. නිකන් ඩෝනට් නෙවෙයි චොක්ලට් ඩෝනට්... ආ මෙන්න කන්න.” මං එදා වැඩ කරලා ලැබුණ අමතර මුදලින් ඩෝනට් ගත්තේ කැමීලියා පොඩි කාලේ ඉදන් කන්න කැමතිම ඩෝනට් නිසා.

“ඩෝනට්... මට එපා.”

“ඇයි එපා කියන්නේ? තාත්තා දුවටනෙ ගෙනාවේ.”

“එකපාරක් කිව්වානේ මට එපා. පුළුවන් නම් මට ලැප්ටොප් එකක් අරන් දෙන්න. අනික මට දුව කියන්න එපා. මම කැමීලියා.”

“දුවගේ ඉස්කෝලෙ වැඩ වලට දැන්ම ලැප්ටොප් එකක් ඕනෙ නෑනේ. මං කැමීලියා ලොකු වෙලා ඉස්කෝලෙන් අයින් වෙලා වැඩිදුර අධ්‍යාපනය කරද්දි කොහොම හරි ලැප්ටොප් එකක් අරන් දෙන්නම්. දැන් තාත්තා ගෙනාපු ඩෝනට් කන්නකෝ. ඔයාටනේ ගෙනාවේ.”

“ මට එපා , මට එපා” තරහෙන් එහෙම කියාගෙන ගිය විදියට නම් මට මේ ඉන්නේ මගේ කැමීලියා ද කියන එකත් හිතා ගන්න බැහැ.

“කැමීලියා... ඔහොම ඉන්න, මං උපරිම ඉවසුවා. මොකද්ද මේ එකපාරටම ඔයාට වෙලා තියෙන්නේ? හැමවෙලේම තරහා යනවයි මුරණ්ඩුකමයි ඕක කරුණාකරලා නවත්වන්න. මං කවදාවත් ඔයාට මෙහෙම කතා කරලා නෑ කියලා ඔයා දන්නවනේ. ආයේ මෙහෙම මුරණ්ඩු වෙන්න එපා.” ඒ මං

කැමීලියාට තරහින් කතා කරපු පළවැනි අවස්ථාව. මං කවදාවත් එහෙම මගේ දුවට කතා කරන්න බලාපොරොත්තු වුණේ නැහැ. ඒත් මගේ හිතට වේදනයි. මේ මගේ දුව මට කතා කරන විදියට.

''ඔව් මං දුප්පත්. ඒත් එහෙමයි කියලා මං ඔයාට කිසිම දෙයකින් අඩුවක් කරලා නැහැනේ. මං පුළුවන් හැම වෙලේම ඔයාගේ සතුට වෙනුවෙන් වැඩ කරේ ඒත් ඔයා දැන් මේ කතා කරන විදියට මට පුදුමයි ඔයා ගැන. කෝ අර ඉස්සර හිටපු අහිංසක තාත්තාට ආදරේ කැමීලියා?''

''ඇති තාත්තා. මං ඉස්සර හිටපු කැමීලියා ඇන්ඩ්‍රූසන් තමයි. ඒත් මට දැන් මේවා එපා වෙලා. මගේ වයසේ අනිත් අයට එයාලගේ දෙමාපියෝ කොච්චර සල්ලි දෙනව ද? අඩුම තරමේ මට මගේ අම්මාවත් නෑ.'' කැමීලියා එහෙම කියාගෙන ගිහින් කාමරයේ දොර වහගත්තා.

අම්මා නැති අඩුව පුරවන්න අමරුයි. ගැහැනු ළමයෙක්ට අම්මා ඕනෙම අවස්ථා වලදී කැමීලියාට අම්මා හිටියෙ නැහැ. එහෙමයි කියලා මං ආදරයෙන් අඩුවක් කලෙත් නෑ.

කොහොම හරි කැමීලියාගේ මුරණ්ඩුකම එන්න එන්න වැඩි වුණා. මං වැඩිය එයාගේ මුරණ්ඩු කමට මුකුත් නොකීවේ එයා හොඳින් එයාගේ ඉගෙනීමේ වැඩ කර ගන්න නිසා. ඒත් එන්න එන්නම මාව දකින එක පවා එයාට එපා වෙලා. මං දන්නෙ නෑ එයාට මගෙන් වුණ අඩුපාඩුකම මොකද්ද කියලා. ඒත් අවසානේ මගේ කැමීලියා මගේ හීනය හැබෑ කලා. මගේ හිතේ තිබ්බ හීනය එයා හොදට ඉගෙනගෙන ඩොක්ටර් කෙනෙක් වෙන එක. අන්තිමට කොහොම හරි මගේ පුංචි කැමීලියා ලොකු දොස්තර නෝනා කෙනෙක් වුණා. එදා මේ ලෝකේ වැඩියෙන්ම සතුටු වෙන්න ඇත්තේ මම. මට දැනුනේ මං මුළු ලෝකෙම දින්නා වගේ. ඒත් ඒ සතුට වැඩි කල් තිබ්බෙ නැහැ.

කැමීලියාට දැන් තමන්ට ඕනෙ විදියකට ජීවත් වෙන්න සල්ලි තියෙනවා. ඒත් දැන් එයාට මාව ලොකු බරක්. තාත්තා කියන කෙනා දැන් එයාට ඕනෙ නැහැ. ඒ නිසා.....

" තාත්තේ, මට දෙයක් කියන්න තියෙනවා. ඔයා දන්නවානේ මං දැන් ඩොක්ටර් කෙනෙක්. මට මගේ දේවල් තනියම කරගන්න පුළුවන්. ඔයා එක්ක ඉස්සර හිටියටත් වඩා හොදට දැන් මට ජීවත් වෙන්න පුළුවන්. අනික දැන් නිතරම මගේ ගොඩක් යාළුවෝ ගෙදරට එනවා. එයාලා මගෙන් ඔයා කවුද කියලා අහද්දි, මං කොහොමද ඔයා මගේ තත්තා කියලා කියන්නේ. එයාලා මට හිනා වෙයි මෙච්චර දුප්පත් ද ඔයාගේ තාත්තා කියලා. ඒ නිසා මං කියන්නේ ඔයාටයි මටයි දෙන්නටම සතුටින් ඉන්න පුළුවන් දෙයක්. අර්... ඔයාට පුළුවන් ද... වැඩිහිටි නිවාසයක ඉන්න. මට පුළුවන් මාසෙන් මාසෙට ඒකට සල්ලි දාන්න. අනික ගෙදරට වඩා එතැන ඔයාට හොද වෙයි... ඉතින්..."

" හරි හරි.. ඕනෙ නෑ. මට තේරෙනවා. කොහොමත් මට ඕනෙ කරේ ඔයාට අනාගතේ ලස්සනට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් හදන එක. මගේ වැඩේ හරි. ඒ ගැන මට සතුටුයි. මං අදම යන්නම්... ඒක මට සැනසුමක්. ඔයා පරිස්සමින් ඉන්න. තෙරුවන් සරණයි!" මාව බරක් ලැජ්ජාවක් වෙන තැනක ඉන්නවට වඩා එතැනින් ඉවත් වෙන එක හොදයි කියල මට තේරුණා. ඒ නිසයි මං මෙහෙට ආවේ.

"දැන් ජේම්ස් සතුටින් ද ඉන්නේ? ජේම්ස් එදා ඔය දරුවා වෙනුවෙන් හමුදාවෙන් ඉවත් නොවුණා නම් අද කොයි වගේ තැනක ඔයා ඉදී ද? සමහරවිට හමුදා ප්‍රධාන නිළදාරියෙක් වගේම හනා එක්ක සතුටු පවුල් ජීවිතයක් ගත කරන්න තිබ්බා. ඒත් අද ඔයා මේ වගේ මහළු නිවසයක..."

"මං දුක් වෙන්නෙ එදා ගත්ත තීරණය ගැන නෙවෙයි හෙන්රි. මං කණගාටු වෙන්නේ කැමීලියා අද මට සළකන විදිය ගැන. එදා එයාව භාර අරගෙන හොදට ඉගැන්නුවේ නැත්තම් අද එයා ඩොක්ටර් කෙනෙක් නෙවෙයි.

ඒ ගැන මං සතුටු වෙනවා. ඒත් මං ජීවිතේ කවදාවත්ම හෙන්රි එක්ක මෙහෙම මහළු නිවාසයක හමුවෙන්න බලාපොරොත්තු වුණේ නැහැ.''

''මම අද මේ නිවාසය ගැන තොරතුරු ගන්න තිබුණ නිසයි ආවේ. මාත් කවදාවත්ම ජේම්ස්ව මෙහෙම මෙහෙදි හම්බවෙයි කියලා හිතුවේ නැහැ.''

''මේක තමයි ජීවිතේ කියන්නේ හෙන්රි. අපි කවදාවත් හිතන්නෙ නැති ගොඩක් දේවල් දෙවියො අපේ ජීවිතේට ළගා කරනවා. ඒ හැමදෙයක්ම හිතේ ලොකු ශක්තියක් තියන් අපි දරාගන්න ඕනේ. අන්න ඒකටයි ජීවත්වෙනවා කියන්නෙ.''

''මට තාමත් පුදුමයි. ඔයාට ඕනෙ තරම් අවස්ථාව තිබුණා කැමීලියා ඔයාව මෙහෙම වැඩිහිටි නිවාසයකට දාන්න යද්දි නීතිමය ක්‍රියාමාර්ග ගන්න. ඒත් ඔයා... කොහොමද මේ හැමදෙයක්ම විද දරා ගන්නේ?''

''හහ්... ඔව්, ඕනෙ තරම් අවස්ථාව තිබ්බා. ඒත් කැමීලියා මාව ප්‍රතික්ෂේප කරලා ඉවරයි. ඉතින් මට ඕනෙ නෑ එයාගෙ අකමැත්තෙන් තවදුරටත් එයා ළග රැදෙන්න. කොහොමත් පොඩි කාලේ ළමා නිවාසයක ජීවත් වුණ මට ජීවිතේ අන්තිම කාලයේ තනියම වුණත් වැඩිහිටි නිවාසයක ගෙවන එක අමාරු දෙයක් නෙවෙයි. දැන් මාස අටක් මං මෙහෙ ජීවත් වෙනවා. මං කැමීලියා ගැන ගොඩක් බලාපොරොත්තු තියා ගත්තා. මොකද මං එයා ගැන හිතුවේ මගේම දරුවෙක් විදියට. ඒත් මොනවා කරන්නද මේකයි මගේ ජීවිතේ.''

''ජේම්ස්ගේ හිත ගොඩක් ශක්තිමත්. මට හිතෙන්නේ කැමීලියාට තියෙන දරු සෙනෙහස තවමත් ඒ විදියටම ජේම්ස් ළග තියෙනවා.''

''අනිවාරයෙන්ම. කැමීලියත් මං වගේමයි. මට පුංචි කාලෙදිම දෙමාපියෝ අහිමි වුණා. කැමීලියාටත් එහෙම්මයි. ඒත් එයා දන්නෙ නැහැ මං එයාගේ තාත්තා නෙවෙයි කියන එක. ඒක කවදාවත් එයා දැනගන්නවට මං කොහෙත්ම කැමති නැහැ. ඒත් මගේ ජීවිතේ එක් කාල පරිච්ඡේදයක් ලස්සන කරපු ඒ රෝස මලට මං තවමත් අදරෙයි.''

“තාත්තා.........”

“කැ.. කැ.. කැමීලියා....”

“අනේ තාත්තේ මට සමාවෙන්න. මට තේරෙන් නෑ මං කොහොමද සමාව ගන්න ඕනේ... හඟ්.. හඟ්... මං කියපු හැම හිත රිදෙන දේකටම සමාවෙන්න තාත්තේ...හඟ්..හඟ්..”

“කැමීලියා.... ඔයා මෙහෙ?”

“ඔව් තාත්තේ, තාත්තගේ රෝස මලට සමාවෙන්න...හඟ්... වෙන කෙනෙකුගේ දරුවෙක් කියන එක දැන දැනම තාත්තාගේ තරුණ කාලේ මං වෙනුවෙන් කැපකරාට පින් තාත්තේ... ඒ වගේ ආදරණීය හදවතකට මං මේ කරපු දේවල් ගැන මං දැන් පසු තැවෙනවා.”

“ඔ..ඔ..ඔයා ඒ ගැන දන්නවා... ඒත් කොහොමද?”

“ අද උදේ තාත්තගේ කාමරේ අල්මාරිය අස්කරන්න හිතන් කාමරයට යද්දි මට හම්බුනේ තාත්තා ඒ දවස් වල ඉදන් ලිව්ව දිනපොත. හඟ්.. හඟ්.. ඒකෙ මං ගැන ලියලා තිබුණ හුරතල් කතා දැකලා කියවන්න ආස හිතුණා. ඒත් ඒක ඇතුළ තියෙන මෙච්චර කාලයක් තාත්තා හංගන් ඉන්න ඒ රහස මං දැනගත්තා තාත්තේ. එදා ඒ යුද්දේ දවසේ අම්මා තත්තා නැති මේ මාව හඟ්.. හඟ්.. මැරෙන්න නොදී ආරක්ෂා කරලා මං වෙනුවෙන් කරපු හැමදෙයක් ගැනම.. හඟ්.. මං දැන් දන්නවා තාත්තේ. මට සමාවෙන්න...හඟ්.. හඟ්..”

“මං කවදාවත් කැමති වුණේ නැහැ ඔයා මේ දේවල් දැනගන්නවට. ඒත් කොච්චර දේවල් සිද්ධ වුණත් තාත්තා ළග එයාගේ කැමීලියාට තිබුණ ආදරේ තවම එහෙම්මමයි දුවේ..”

“මට දස දහස් වාරයක් සමාවෙන්න මං මගේ තාත්තාට කරපු දෙයට. අනේ දැන් අපි අපේ ගෙදර යමු. හඟ්.. මට මං කරපු හැමදෙයක්ම ආයෙමත් හරි ගස්සන්න ඕනේ තාත්තේ...හඟ් හඟ්..”

“පහුවෙලා හරි දුවට හරි දේ තේරුණු එක ගැන සතුටුයි. ජේම්ස් අද ඉදන් හැමදෙයක්ම අමතක කරලා දුව එක්ක හොදින් ජීවත් වෙන්න. දුව තාත්තව හැමදාම හොදින් බලාගනී කියලා මං විශ්වාස කරනවා.”

“ ආයේ කවදාවත් මං හිතුවක්කාර වෙන්නෙ නැහැ තාත්තේ. ඉස්කෝලෙ අනිත් පොහොසත් අයට තියෙන දේවල් දැකලා මං ගොඩක් හිතුවක්කාර වුණා. ඒත් දැන් මට තේරෙනවා ඒ කාලේ තාත්තා අමාරුවෙන් වෙහෙසිලා මං වෙනුවෙන් කොච්චර දේවල් කරාද කියලා. මගෙන් ආයේ තාත්තාට කිසිම වරදක් වෙන්න මං ඉඩ තියන්නෙ නැහැ. මං තාත්තාට ආදරෙයි තාත්තේ.....”

“තාත්තත් දුවට ආදරෙයි. හැම තාත්තා කෙනෙක්ටම ඕනේ තමන්ගේ දරුවෝ සතුටින් ඉන්නවා බලන්න. ඒ නිසා දැන් කැමීලියා ඔය කදුළු පිහිද ගන්න. මට ආසයි අර ලස්සන හුරතල් හිනාව ආයේ වතාවක් දකින්න.”

*‘සගවන ආදරයේ උරුමක්කාරයා තාත්තා විතරමයි’*

*...නිමි...*



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ හාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය හික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුහවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග හාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුහාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්